# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2156/14 - 2019 දෙසැම්බර් මස 31 වැනි අඟහරුවාදා - 2019.12.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : 3/2/ඉඅත්/189.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/4/2014/ඩී/328.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 5 වන සන්නද්ධ බුද්ධි බලකා කඳවුරට ඇතුල්වීම සඳහා ප්‍රවේශ මාර්ගයක් සකස් කර ගැනීම සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර - මු.පි.කො. 9849*

කොළඹ දිස්ත්‍රික්කයේ, සීතාවක (හංවැල්ල) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුගහපත්තුව සුළු කොට්ඨාසයේ, 436ජී - සුදුවැල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කළුඅග්ගල ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක කො.9849 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 සහ 02 පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1685 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කොටසට මායිම්:

**කැබලි අංක 01**

ඉඩමේ නම: උණපඳුරේ ඕවිට *නොහොත්* අට්ටික්කාගහ ඕවිට *නොහොත්* උණපඳුරේ ඕවිට සහ අට්ටික්කාගහ ඕවිට වර්තමානයේ උණපඳුරේ වත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: හංවැල්ල, පහල කළුඅග්ගල, අංක 120 හි පදිංචි කත්‍රිආරච්චිගේ දොන් ප්‍රැන්සිස් ලැම්බර්ට්; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1663.

**කැබලි අංක 02**

ඉඩමේ නම: සොයාගත නොහැක; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0022.

ඉහත ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 පෙබරවාරි මස 19 වැනි දින පූ.භා. 10.00ට සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2020 පෙබරවාරි මස 12 වැනි දිනට මත්තෙන් එකී ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය. අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂණයේදී මා වෙත ඉදිරිපත් කළ යුතුය.

කේ. එස්. දිල්හානි,
ප්‍රාදේශීය ලේකම්/ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
සීතාවක.

සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.
01-448

ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/6/2013/එච්ඩබ්ලිව්/441.
*මගේ අංකය*: 3/3/2/85.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වෙනි වගන්තියට යටත්ව අංක 2049/27 හා 2017.12.14 දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* III වැනි කොටසේ පළකරන ලද දැන්වීමේ 2ඒ පිටුවේ සඳහන් කැඩැස්තර සිතියම් අංක 520017 කලාප අංක 07 හි පත්‍ර අංක 11 හි කැබලි අංක 320 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0112 ක් වූ රතඹලාහේන නමැති ඉඩම සහ සර්වේයර් ජනරාල්ගේ අංක සීඕ/එච්එම්ජී/2019/196 හා 2019.09.26 දින දරන අනුරේඛණයේ කැබලි අංක ඒ ලෙස සඳහන් වී ඇති රජයට අත්කර ගෙන ඇති හෙක්ටයාර් 0.0047 ක් වූ රතඹලාහේන නමැති ඉඩම් කැබැල්ල කෝට්ටේ බෝපේ මාර්ගය පුළුල් කිරීම සඳහා අත්කර ගෙන ඇති බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

2019 දෙසැම්බර් මස 27 වන දින,
හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-449

---

ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/6/2013/එච්ඩබ්ලිව්/440.
*මගේ අංකය*: 3/3/2/84.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වෙනි වගන්තියට යටත්ව අංක 2091/12 හා 2018.10.02 දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* III වැනි කොටසේ පළකරන ලද දැන්වීමේ 8ඒ පිටුවේ සඳහන් කැඩැස්තර සිතියම් අංක 520014 කලාප අංක 10 හි පත්‍ර අංක 19 හි කැබලි අංක.384 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0076 ක් වූ නුගගහලන්ද නමැති ඉඩම සහ සර්වේයර් ජනරාල්ගේ අංක සීඕ/ එච්එම්ජී/2019/67 හා 2019.05.16 දින දරන අනුරේඛණයේ කැබලි අක්ෂර ඒ ලෙස සඳහන් වී ඇති රජයට අත්කර ගෙන ඇති හෙක්ටයාර් 0.0015 ක් වූ නුගගහලන්ද නමැති ඉඩම් කැබැල්ල, කැඩැස්තර සිතියම් අංක 520014 කලාප අංක 10 හි පත්‍ර අංක 19 හි කැබලි අංක 231 හි කොටසක් ලෙස කොට්ටාව තලගල මාර්ගය පුළුල් කිරීම සඳහා අත්කර ගෙන ඇති බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

2019 දෙසැම්බර් මස 27 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-450

---

ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/6/2013/එච්ඩබ්ලිව්/440.
*මගේ අංකය*: 3/3/2/84.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වෙනි වගන්තියට යටත්ව අංක 2091/12 හා 2018.10.02 දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* III වැනි කොටසේ පළකරන ලද දැන්වීමේ 8ඒ පිටුවේ සඳහන් කැඩැස්තර සිතියම් අංක 520014 කලාප අංක 11 හි පත්‍ර අංක 10 හි කැබලි අංක. 159, 162 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0031 සහ 0.0002 ක් වූ ගල්කන්දෙවත්ත නමැති ඉඩම සහ සර්වේයර් ජනරාල්ගේ අංක සීඕ/එච්එම්ජී/2018/789 හා 2019.05.14 දින දරන අනුරේඛණයේ කැබලි අක්ෂර ඒ ලෙස සඳහන් වී ඇති රජයට අත්කර ගෙන ඇති හෙක්ටයාර් 0.0026 ක් වූ ගල්කන්දෙවත්ත නමැති ඉඩම් කැබැල්ල කොට්ටාව තලගල මාර්ගය පුළුල් කිරීම සඳහා අත්කර ගෙන ඇති බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

2019 දෙසැම්බර් මස 27 වන දින,
හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 - 451

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.